ඉන්දියාවෙන් ඇවිල්ලා හිටිය අපර්ණා මුකර්ජි කියන හින්දි ගායිකාව හා යුග ගීතයක් ගායනා කළා. රාජේන්ද්‍ර කුමාර් රගපෑව චිත්‍රපටියක එන මොහමඩ් රාෆි ලතා මංගේෂ්කාර් ගායනා කළ ''වෝදිනි යාදි කරෝ'' කියන ගීතය. අමිතාබ් බච්චන් ලංකාවට ආ අවස්ථාවක සනත් ගුණතිලක මා අමිතාබ්ට හඳුන්වා දුන්නා. අමිතාබ් රගපෑව අභිමාන් චිත්‍රපටයේ ''මීතිනා මිලාරේ මන්කා'' ගීතය මම ගායනා කළාම අමිතාබ් විශ්මිත වුණා.
ඔබ අතිශය සාර්ථකත්වයට පත්වෙනසිංහල

**චිත්‍රපට ගී ගායනයට යොමුවූයේ කෙසේද?**

ඕක පියවරෙන් පියවර කිව්වොත් මෙහෙමයි. හින්දි ගී ගයමින් ඉන්න අතරේ මට හිතුනා සිංහල ගී ගායනට යොමුවෙන්න ඕනේ කියලා. මුලින්ම මම ගී හතරක් තැටිගත කළා. ඔය කාලේ තමයි ලංකාවට කැසට් පට එන්නේ. එතනදි මට පුළුවන් වුණා සිසාරා ලේබලය යටතේ හින්දි නොනවතින වේග රිද්ම ගී කැසට් පට කීපයක් කරන්න. ප්‍රථම කැසට් පටය ඩිස්කෝ ගීත් මාලා. ඒකෙ සාර්ථකත්වය නිසා ගීත්මලා 84, 85, 86, 87 වගේ කැසට් පට ගණනාවක් කරන්න පුළුවන් වුණා. ඊට පස්සේ කළ සිංහල ගී කැසට් එකේ තිබුණ අජන්තා රණසිංහ ලියූ ''කඳුලින්ම ගැයූ පෙම් ගීතේ'' ගීය ගායනයෙන් පස්සේ බොහෝ දෙනෙක් මගේ හඬ සිනමාව සඳහා සුදුසුයි කියලා පිළිගත්තා.

ඔය අතරේ තමයි එච්.ආර්. ජෝතිපාලයන් අපෙන් සමුගත්තේ. ඉන් පස්සේ සිනමාකරුවන් සිනමාවට සුදුසු හඬවල් සෙව්වා. මගේ නමත් බොහෝ දෙනෙක්ගේ කතාබහට ලක්වෙලා තිබුණා. ඒ කාලේ ප්‍රවීණ ශබ්ද පාරිපාලක මර්වින් බෙන්ස් පත්තරේකට කියලා තිබුණා ඇයි චිත්‍රපට නිෂ- පාදකයන් නුවන් ගුණවර්ධන උත්සාහ කරන්නේ නැත්තේ කියලා.

හර්බට් රංජිත් පීරිස් ජෝතිපාල ඉන්න කාලෙම ''ඇර සොයිසා'' චිත්‍රපටියට මගේ හඬින් පද කීපයක් ගායනා කරවාගෙන තිබුණා. නමුත් ජෝතිගේ මහමෙර වගේ දැවැන්ත හඬ පෞර්ෂය ඉදිරියේ අවුරුදු විසි දෙකක මගේ හඬෙ ශක්තියක් තිබුණේ නෑ. පසුව බැප්ටිස්ට් ප්‍රනාන්දු කළ ''මැතිණිය'' චිත්‍රපටියේ ලතා වල්පොල සමඟ ''තුරුවැල් හිනැහෙයි තටුසළා'' කියන යුග ගීතය කියන්න මට අවස්ථාව ලැබුණා. මේ වෙනකොට චිත්‍රපටි හැටක ගීත දෙසීයක් පමණ මා ගායනා කරලා තියනවා.

**සිනමා ගී ගායනයේදි ලැබිලා තියන අගැයීම්?**

සනත් ගුනතිලක, ජීවන් කුමාරතුංගගේ ඉදලා රෙ-ෂාන් රණවන දක්වා සිනමාවේ හැම නළුවෙකුටම වගේ මම පසුබිම් ගායනා කරලා තියනවා. ඒවට මට විශාල රසික ප්‍රතිචාරයක් ලැබිලා තියනවා. '' ඔයා කියනවා කියලා දැනෙන්නේ නෑ හරියට නළුව කියනවා වගේමයි" කියලා හුගදෙනෙක් මට කියලා තියනවා. ඒක තමයි සිනමා ගී ගායනයේදී මම ලැබුව උසස්ම සම්මානය, උපහාරය. ක්ෂේත්‍රය තුළ මට කිසිම දවසක කිසිම ඇගයීමක් ලැබිලා නෑ. අඩුම තරමේ මේ වෙනකම් කිසිම සිනමා සම්මාන උළෙලකට කැදවීමක්වත් මට ලැබිලා නෑ. සිනමාවට සම්බන්ධයක් නැති ශිල්පීන් ගී ගයන සිනමා සම්මාන උළෙලවල් පවා මම දැකලා තියනවා.

මාව මේ විදිහට කොන්කිරීම ගැන මුලදි මට විශාල වේදනාවක් දැනුනත් පසුව අධ්‍යාත්මික චින්තාවෙන් ඒ දෙස උපේක්ෂාවෙන් බලන්න මම පුරුදු වුණා. චිත්‍රපටි හැටකට ගී දෙසීයක් ගායනා කළ ශිල්පියෙක් වුවත් කිසිම සිනමා සම්මාන උළෙලකට කැඳවීමක්වත් නොලද ගායන ශිල්පියෙක් විදිහට මම තීරණය කරලා තියනවා මගේ ජීවිතයේ කිසිම දවසක එවැනි සිනමා උළෙලකට සහභාගි නො-වෙන්න.

**ඔබ හිතන හැටියට ඇයි ඔබව සිනමා කුලකයෙන් මේ විදිහට බැහැර කරලා තියනවා ඇත්තේ?**

එච්. ආර්. ජෝතිපාල කියන අසහාය සිනමා ගායන ශිල්පියාගේ හඬින් සිනමාව දුවන කාලෙත්, බොහෝ කලාකරුවන් පවා ඔහුගේ හඬින් ජීවත්වුණ කාලෙත් ඔහුව කිසිම ඇගයීමකට ලක් කළේ නෑ. ඒ විතරක් නෙවෙයි. ඔහුව හෙළා දැක්කා. පීචං ගායකයා කියලා කිව්වා. ගුවන් විදුලිය පමණක් තියන කාලේ වසර හතක් ජෝතිපාලගේ ගීත ප්‍රචාරය කරන එක නවත්තලා තිබුණා. ඒ තත්ත්වයම තමයි අද මටත් උදාවෙලා තියෙන්නේ. දවසක් ජෝතිපාල රූපවාහිනී වැඩසටහනකදි කිව්වා මට පීචං ගායකයා කියලා කියනවා. මම ඒකට දුක්වෙන්නේ නෑ. කවදා හරි ජනතාව මාව ප්‍රතික්ෂේප කරනකම් මම ගීත ගායනා කරනවා කියලා. මට වෙලා තියෙන්නෙත් ඒකමයි කියන අදහසේ තමයි මමත් අද ඉන්නේ.

**ඔබේ සමකාලීන බොහෝ ගායක ගායිකාවන්ට මෙන් ඔබට ඔබේ ගායන කුසලතා එළිදක්වන්න ගුවන් විදුලියෙන්වත් අත්වැලක් ලැබුණාද?**

මම ප්‍රසංග වේදිකාවේ ස්ථාවරව ඉන්න කාලේ එක් අවස්ථාවක මම ගුවන් විදුලි සංස්ථාවේ සරල ගී පරික්ෂණයකට ඉදිරිපත් වුණා. එයින් ''ඒ''ශ්‍රේණියේ සරල ගී ගායකයකු ලෙස සාමාර්ථයක් ලැබුවා. ඒ සහතිකයත් අරගෙන පසු අවස්ථාවක මම ගුවන් විදුලි සංස්ථාවට ගිහින් නිලධාරින් හමුවෙලා මම ඇහුවා මේකට මට සරළ ගී වැඩසටහනක් දෙනවද කියලා.




''මේ මේ ඔයාට වැඩිය දක්ෂ විදිහට ගයන අයත් තව ඕනේ තරම් ඉන්නවා. ඒ නිසා පොඩ්ඩක් ඉන්න'' කියලා ගුවන් විදුලියේ අය මට කිව්වා.

මම ආපසු ගෙදර ආවා. කාලයක් යනකම් නැවත නැවතත් බොහෝ දෙනෙකුගෙන් ඇසුවා මට අවස්ථාවක් දෙන්නේ නැත්ද සරළ ගී කීපයක් ගයන්න කියලා. නමුත් අද වෙනකම් කිසිම ගී නිර්මාණයක් කරන්න මට ගුවන් විදුලි සංස්ථාවෙන් අවස්ථාවක් ලැබිලා නෑ.

**ඔබගේ ඒක පුද්ගල ගී ප්‍රසංගය මෑතකදි දැකගන්න ලැබුණේ නැත්තේ ඇයි?**

ඒක පුද්ගල ප්‍රසංගයක් පවත්වන්න අඩුතරමේ ජනප්‍රිය ගීත දහඅටක් විස්සක් විතරවත් අවශ්‍ය වෙනවා. මම ගායනා කරලා තියන චිත්‍රපටි ගී බොහොමයක් චිත්‍රපටි රෝල් අස්සේ සැඟවිලා ගිහින් තියෙන්නේ. ගුවන් විදුලියෙන් ප්‍රචාරය වන මගේ ජනප්‍රිය ගීත තියෙන්නේ අතේ ඇඟිලි ගානට අඩු ප්‍රමාණයක්. ඒනිසා හින්දි ගීතත් ඇතුළත් කර මම ''නුවන් රාත්‍රිය'' ඒක පුද්ගල ප්‍රසංගය කළා. අවස්ථා ගණනාවක් ඒක පවත්වලා තියනවා. අවසාන වරට 2010 වසරේදි මහරගමදි ප්‍රසංගය පැවැත්තුවා. නමුත් අනුග්‍රහයක් දක්වන්න කෙනෙක් ඉදිරිපත් නොවුණ නිසා එදායින් පස්සේ ප්‍රසංගය පවත්වන්න අවස්ථාවක් ලැබුණේ නෑ. අනුග්‍රහයක් ලැබුණොත් හෙට වුණත් ආයෙත් පටන් ගන්නවා.

**පවුලේ තොරතුරු ටිකකුත් කිව්වොත්?**

කලා ජීවිතයටත් වඩා මම ඇලුම් කරන දෙයක් තමයි මගේ පවුල් ජීවිතය. බිරිඳගෙන් මට විශාල සහායක් ලැබෙනවා කලා කටයුතු කරගෙන යන්න. මගේ දුව දුලාරි. පුතා ගයාන්. දෙදෙනාම පරිගණක ක්ෂෙත්‍රයේ ඉහළට අධ්‍යාපනය ලබලා හොඳ රැකියාවල නියුතුවෙනවා. දෙදෙනාම සංගීතයට සහ හින්දි භාෂාවට දක්ෂයි. විශේෂයෙන්ම පුතා අනාගතයේදී දෙවෙනි නුවන් කෙනෙක් වෙයි කියලා මම හිතනවා. මේ වෙන-කොට ඔහු ගිටාරය සහ පියානෝව වාදනයට විශේෂ දක්ෂකමක් දක්වනවා. ඕඩියෝ ඉංජින-යරින් ඩිප්ලෝමාවක් හදාරමින් සිටිනවා.

*(අංක 92, නාලන්දාරාම පාර, පතිරගොඩ, මහරගම නුවන් ගුණවර්ධනගේ ලිපිනයයි. 011-2841476 සහ 0777-742082 යන දුරකථන අංකයන්ගෙන්ද ඔබට ඔහු ඇමතිය හැකිය.)*

VCE Excellence –Since 1998

Affordable Private Tutoring for VCE Year 11 & 12
PHYSICS (2014/2015)

10% OFF all group classes when you show this ad

Face the challenges of VCE with the best learning strategies and achieve A+ results!

Hurry! Very limited places available for Individual tutoring for students in North & North West of Melbourne.

Small group class for students from Melbourne High School.
Physics Unit 1&2 – Saturday 3.30pm, to commence on 23rd November at ecoBright Learning Centre, Tullamarine. Register your interests now as only limited places are available.

CLOSING THE GAP- A Special Physics and Science Foundation Course to prepare students for the VCE Year 11 Physics. Affordable 3 weeks(6 hours) group class to commence from 23rd Nov at Tullamarine.

GAMSAT Science Preparation Classes over 3 weeks in December 2013 at ecoBright Learning Centre, Tullamarine. Email us for more details….

Email:
vce.excellence@gmail.com
Or ring Wasantha or Sumudu Perera on 03 93351595(all hrs)

LANKAN AUTO CARE
Licensed Roadworthy Tester (R.W.C)



ALL MECHANICAL REPAIRS
LOG BOOK SERVICE | ELECTRICAL REPAIRS
AUTO TRANSMISSIONS | BRAKES & CLUTCHES
FUEL INJECTION | COMPUTER DIAGNOSTIC




Ranjith Perera
Mob: 0409 866 886
9798 2200
14/30 Tower Court
Noble Park 3174